"සුනිල් මාධව ප්‍රේමතිලක" නම් ඔහු....

ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර



එදා එසේ ලියුව ද අද 70 වෙනි වියට පා තබන මොහොත වන විට අද අහිංසකයින්ගේ ආරාමය තිබූ තැනක සලකුණක් හෝ සොයා ගැනීමට නොහැකි තරමට සුන්දර මල් වෙළඳ සංකීර්ණයකි. ලස්සන පිඟන් ගඩොල් අතුරා පිළියෙළ කර ඇති අවිදින මං තීරුවල සුන්දර ලලනාවෝ ආහාර දිරවනු පිණිස දුවමින් සිටිති. පාරෙන් මෙහා පස පැවති නාලන්ද එල්ලාවල පිළිරුව ද නැත. අහිංසකයින්ගේ මළ මිනී වෙන්දේසි කරමින්, ජීවිත මව්වරුන් පියවරුන්ගේ ලේ ඩහදිය කඳුළු මතින් ඉහළ නඟින උන් ජීවත් වන්නවුන්වත් වැඩියෙන් මිය ගියවුන්ට බියය. ස්මාරක මිහිදන් වන්නේ ඒ නිසාය. තම මිත්‍රයාගේ ඝාතකයින්ට දඬුවම් දෙන්නට මිනියේ අත තබා දිවුරූ ඩිලාන් පෙරේරලා ඝාතකයින් සමඟ එකම කැබිනෙට්ටුවේය.*

"සුනිල් මාධව ප්‍රේමතිලක" නම් ඔහු....

පෙර සටහන

මා අභියස කෘතියකි. එහි නම "පෙරමුණක් නැති සෙනෙවියෙකුගේ කගපතක මුවහත" යන්නයි. කෘතියේ මූලාරම්භයේ කොළඹ යුගයේ කවියෙකු ලෙස පෙළපොතින් හඳුනා ගෙන සිටි මිමන ප්‍රේමතිලකගේ පුද්ගලික අත්දැකීමකි. ඉන්දීය ශාස්ත්‍රඥයෙකු ලෙස එවක ප්‍රකටව සිටි බස මාධව බරුවාගේ දේශනයක් වාර්තා කරන්නට ගොස් දේශන ශාලාවේ අසුන්ගෙන සිටි මිමන, ආරෝහ පරිණාහ දේශයකින් යුතු පිළිවෙළකට ඇඳපෑළඳ ගත් හැඩකාරයෙකු සිතින් මවාගෙන සිටියේය. " වේදිකාවට ගොඩ වූයේ සිහින් සිරුරක් ඇති පුද්ගලයෙකි. ඔහුගේ හිසකේ අවුල් වී ගොසිනි. ටයි පටියක් පළඳා සිටි නමුත් එහි කිසිදු හැඩයක් පිළිවෙළක් නැත. බාගයට දමා තිබුණු ටයි ගැටයත්, පැත්තකට වීසි වූ ටයි පටියත් නිසා ඔහු කෙරෙන් විද්‍යමාන වූයේ තරමක අමුතු ආකාරයේ පෙනුමකි. මේ කිසිසේත්ම මාධව බරුවා විය නොහැකි යයි මිමන සිතීය. එහෙත් මිමනගේ සිතුවිල්ල සාවද්‍ය කරමින් මේ අමුතු මිනිසා දේශනය ආරම්භ කළේය.ළ"(පිටුව.11).

දේශනයෙන් ඉක්බිතිව මාධව බරුවා ගැන උපන් ගෞරවාදරයෙන් යුතුව මිමන ගෙදර ගියේය. තම බිරිඳ වන ඇඩිලින්ට දාව උපදින කුළුඳුල් දරුවාට "මාධව" යයි නම දැමිය යුතු බවට යෝජනා කළේය.

සුනිල් මාධව ට හැත්තෑවයි. මාධ්‍ය ජීවිතය ට පනහයි.

ඒ දෙදාහ දශකයේ මූලාරම්භය යි. පාසල් අධ්‍යාපනයට ආයුබෝවන් කීමෙන් පසු ලිවීමත්, රස්තියාදුවත් ජීවිතය කරගනිමින් ඩොනල්ඩ් වූඩ්ස්, පුලියස් ෆුචික් කියවා එවන් පරමාදර්ශීය පුවත්පත් කලාවේදියෙකු වීමට සිහින දකිමින් සිටි යුගයයි. තැන තැන ධයර් මත දැවී යන මළ සිරුරු, පාසල වසා ඇති බවට තද රතු හෝ කළු අකුරින් ලියා ඇති පෝස්ටර්, පාළු වී ගිය මං මාවත්, බෙරි කරගත් මුහුණින් යුතු වැඩිහිටියන්ගේ නොරිස්සුම් අවවාද පිළිබඳ බොදු වී ඇති මතකයන්ගෙන් යුතු ළමා විය සිහිගන්වමින් කෙනෙකු එවන් මිනිසෙකු ගැන කියා දෙයි.

"ඔයාලා ඒ දවස්වල පොඩි ළමයි. කටක් හොල්ලල මිනිහෙක් කතා නොකරන කාලේ. "ප්‍රේමදාස අපි සූදානම්" කියලා ලක්දිව පත්තරේ හෙඩිම දැම්ම මිනිහෙක්. එක පත්තරයක් වැකිලා තව පත්තරයක් පටන් ගන්න මිනිසුන්ගෙන් සල්ලි එකතු කරන්න තිබ්බ රැස්වීමකට මං ගියා. මනුස්සයා කතා කරා විතරයි වගේ උන්නු ගැහැණු මිනිස්සු අතේ කනේ තිබුණු කණාකර අබරණ ටික ගලවලා දුන්නා."

ඉක්බිතිව මම ඔහු සොයා ගියෙමි. මහජන පුස්තකාලයේ පුවත්පත් ඇංශයේ ද, ජාතික ලේඛන-ාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලිපි ගොනු අතරේ ද සුනිල් මාධව ප්‍රේමතිලක නම් අදීන පුවත්පත් කලාවේදියෙකු, ලේඛකයෙකු ලියූ කියූ දෑ මට හමු විය. මිට පෙරාතුව මා කියවා තිබුණු ඩොනල්ඩ් වූඩ්ස්ගේ කෘතිය "හඬනු මැන නිදහස" නමින් සිංහලට අනුවර්තනය කර තිබුණේ ද ඔහු බව යළි හැඳින ගැනීමට ලැබීමෙන් සියුම් ලජ්ජාවක් ද උපන් බැවි දැනුදු සිහිපත් කළ හැකිය. කෘතියේ කතානායකයා දකුණු අප්‍රිකානු විමුක්ති අරගලයේ කළු ශිෂ්‍ය නායක ස්ටීව් බිකෝ වුවද මාගේ වීරයා වූයේ කෘතියේ කතුවරයා වූ වූඩ්ස්මය. "

සත්‍යවාදියෙකුගේ දිනපොත" විටෙක වෙඩි උණ්ඩයක් තරම් හිත් පසාරු කරවන සුළු වන අතරම තවත් විටෙක දැසට කඳුළු උනන තරමේ සංවේදීය. තවත් විටෙක ලෝකය ගැන අලුත් විදිහට දකින්නට හැඟීම් අවුළුවාලන සුළුය. " උණ්ඩයට බෝම්බයට මුහුණ දෙමින් කරන මේ පත්තර කලාව මොන තරම් සුන්දරද?" 92 ජූනි 1 දා ඔහු සටහන් කර තිබුණි. ජීවිත අවදානම නොතකා ලෝකයේ විවිධ රටවල ඇවිදිමින් තරුණ නැගිටීම ගැන ලියූ ඔරියානා ෆලච් ලංකාවට පැමිණියේ 71 අප්‍රේල් සමයේදී ය. ඒ වන විටත් කැළෑ වැදී සැඟ වී සමාජවාදී සිහිනයක් වෙනුවෙන් අරගල කරමින් සිටි සටන්කාමීන් හමුවීමට යාම සඳහා ගමන් සහචරයෙකු ලෙස ඇය විසින් තෝරා ගනු ලැබුවේ සුනිල් මාධවය. ඔහු පිළිබඳ මාධ්‍ය ක්ෂේත්‍රයේත්, ප්‍රගතිශීලී සමාජයේත් දැල් වී තිබුණු පෞරුෂය තක්සේරු කර ගැනීමට එය ද ප්‍රමාණවත්ය. ග්‍රීසියේ පපඩපවුලෝස් ඒකාධිපතියාට එරෙහිව සටන් කළ, ජනයා ආදරයට "ඇලිකෝස්" නමින් හැඳින් වූ අලෙක්සැන්ඩර් පනාගොලිස් කවියාගේ ජීවිත කතාව "ද මෑන්" යනුවෙන් ලියුවේ ඔරියානාය. එය " මිනිසෙක්" යන්නෙන් සිංහලට අනුවර්තනය කරන ලද්දේ ද සුනිල් අයියා විසිනි.

මේ අනුව ඉතා කෙටි කලක් තුළ ලසුනිල් මාධවල මා හිස තුළ දැවැන්ත ප්‍රතිරූපයක් බවට ප්‍රාදුර්භූත වීම නොවළැක්විය හැකිවිය. 2002 වසරේ මා කැළණිය සරසවියට ඇතුළු වන අතර ටික දිනකින් සුනිල් මාධව අලුත් පත්තරයක් ආරම්භ කිරීමට යන ආරංචිය සැළ විය. ඔහුගේ නිවසේ දුරකථන අංකය සොයාගත් මා ඔහු අමතුවෙමි.

"ඇවිත් මාව හම්බවෙයන්" කෙටි දුරකථන සංවාදයක අවසානයේදී ඔහු කියා සිටියේය.

ඒ වන විට පුවත්පත ප්‍රකාශයට පත්ව නොතිබුණි. නියමිත දිනයේදී මා ලද මග විස්තර හා අංකය අනුව කොටහේන පිහිටි කාර්යාලයකැයි බැලූ බැල්මට කිව නොහැකි නිවසක දොරට තට්ටු කළෙමි.

"මිස්ටර් සුනිල් මාධව ඉන්නවද?"

"මිස්ටර් සුනිල් මාධව කියල කෙනෙක් නම් නෑ. සුනිල් අයිය නම් ඉන්නවා. ඇතුළට යන්න." මුහුණ පුරා රැවුල වවාගත්තු හාදයෙක් කියා සිටියේය. මම කාර්යාලයට ඇතුළු වීමි. මාධව බරුවා දුටු විගස මිමන ඇර්බුදයට යන්නට ඇත්තේ යම් සේක් ද සුනිල් මාධව දුටු විගස එතෙක් මා හිසේ හොල්මන් කරමින් සිටි දැවැන්තයා මොහොතකට සුන්නද්දුලි වී ගියේය. පැරණි ඩෙනිම් කලිසමකට බාගෙට යටකරන ලද පොඩි වුණු කොටු කමිසයකින් යුතු කෙසඟ සිරුරකින් ගෙබි ඔහු මෙසය මත වාඩි වී මත්පැන් වඩියකට වතුර කලවම් කරමින් සිටියේය. එක් අතක ඇඩක් දැවී ගිය සිගරැට්ටුවකි. එක් අතකින් බොකුටු කොණ්ඩය පිරිමැදෙ වේගයෙන් දෙතුන් වරක් ඇසිපිය ගැසූ ඔහු මට කතා කළේය.

"මම සුනිල් අයියා. මෙහේ මිස්ටර්ලවත් මහත්තුරුවත් නෑ. අපි ඔක්කොම යාළුවෝ. අඩියක් ගහලම කතා කරමු." ඔහු වීදුරුවක් මට ද දිගු කළේය. ඉක්බිතිව ඇස් පුංචි කොට සිනාසුනේය. එතැන් සිට ඔහු බොහෝ දෙනෙකුට මෙන් මට ද සුනිල් අයියාම විය.

ඒ අපගේ පළමු හමුවීම ය. සුනිල් අයියාගේ කතෘත්වයෙන් යුතුව ලලක්ජනල පුවත්පත සති කිහිපයක ඇවෑමෙන් එළිදැක්විණි. මා එහි කර්තෘ මාණ්ඩලිකයෙකු නොවූව ද යාවජීව සාමාජිකයෙකු විය. මා පැමිණියේ කොහේ සිට ද කාගේ කවුරුද ද යන්න කිසිවක් ඔහුට අදාළ නොවිණි. පුද්ගලික වතගොත කිසිවක් හාරා අවුස්සා බැලීමේ පුරුද්දක්ද සුනිල් අයියාට නොවිණි. ආධුනිකයින්ට අතදීමට නොපැකිළිව ඉදිරිපත් වීම මෙන්ම පළමු හමුවීමේදීම පුද්ගලයින් අසීමාන්තික ලෙස විශ්වාස කිරීම ඔහුගේ මනුෂ්‍යත්වය විඳනා පාන්තක් වුව ද එයම ඔහුට බොහෝ අකරතැබ්බයන්ට මුහුණ දීමට ද හේතු විය.

ඇත්ත පුවත්පත කොමියුනිස්ට් පක්ෂයේ පුවත්පත වුව ද එහි කතුවරයා ලෙස සිටි පත්තර ලෝකයේ තවත් පරමාදර්ශීය චරිතයක් වන බී.ඒ. සිරිවර්ධන මහතා කිසි කලෙකත් පක්ෂයේ සාමාජිකයෙකු නොවීය. සුනිල් අයියාගේ දේශපාලන දෘෂ්ටිය බොහෝ විටෙක පාහේ ජවිපෙ දෘෂ්ටිය හා සමපාත විය. එහෙත් ඔහු ජවිපෙ සාමාජිකත්වය ලැබුවෙකු නොවන බව අපගේ විශ්වාසයය. ජාතික ගැටළුව මෙන්ම ඇතැම් විට වෙනත් කාරණා සම්බන්ධයෙන් අපගේ අදහස් ජවිපෙ හා නොපෙහෙන අවස්ථාවන් වලදී ලමොන වැරැද්ද තිබ්බත් අපි ඉන්න ඕන කොල්ලන්ගෙ පැත්තෙල හෙතෙම තරයේ කියා සිටියේය. 88*89 පරාජයෙන් පසු අතීතයේ එක් අවස්ථාවක පක්ෂයට වඩා පුද්ගලයෙකු ලෙස සුනිල් අයියා බලවත්ව සිටියේය. කැඩී බිඳී විසිරුණු තරුණ* තරුණියන් ලක්මිණ, ලක්දිව, ආදී පුවත්පත් සෙවණ යටින් යළි ඒකරාශි වන්නට වූයේ ඒ නිසාය. එහෙව් කොල්ලන් එක් අවස්ථාවක පරිවාස ආණ්ඩුවක් ලෙස ද, තවත් අවස්ථාවක අමාත්‍යංශ 4 ක් සහිතවද පාලන බලයේ කොටස්කාරයින් වී සිටියේය. මැතිවරණ සමයක දක්වන ආදරය එකී කොල්ලන්ගෙන් වුව පසු කලෙක දක්නට නොවීය. ඒ ගැන ජයලාල් රෝහණ මෙසේ ලිවීය.

"එහෙනම් ඒ දවස්වල වේදිකාවට නග්ගන කොටත් එයා එහෙමෙන්. එතකොට ප්‍රතිපත්ති වලට මොකද වුණේ?"

"මෙහෙමයි සහෝදරයා, ධනවාදී ආකෘතිය තුළ අපි ඒ ගොල්ලන්ව පාවිච්චි කළා."

"සුනිල් අයියාට අත් වූ ඉරණම ඒකයි"

(පෙරමුණක් නැති සෙනෙවියෙකුගේ කගපතක මුවහත * පිටුව 157)

ලක්ජන පුවත්පත කෙටිකලකින් වැසී ගියේය. කෙටිකලක් තුළ දැන හැඳිනගත් කොටහේන කාර්යාල නිවස අවට බොහෝ දෙනා සුනිල් අයියාගේ හෘදයාංගම බවට ආදරය කළහ. කාර්යාලයෙන් එළියට බසින ලද මොහොතේ බොහෝ පිරිසක් ඩබල්ජනඩ පුංචි පවුලට සමුදන්නට පැමිණ සිටියහ. සියලු දෙනා ආමන්ත්‍රණය කළ සුනිල් අයියා දෑසේ කඳුළු පිසදා ගත්තේ ඉතාමත් අපට ආදරය කරන උන් ඉන්නවා බන්ල කියමිනි. යළිත් පත්තරයකට සම්බන්ධ නොවන බව කීවද 2003 වසරේ රත්මලාන, බොරැපන පාරේ ලක්නද පුවත්පත ආරම්භ කරන විට සුනිල් අයියා නැවත කතුවරයා ලෙස පැමිණියේය. මා එහි ද සාමාජිකයෙකු වීමි. ඒ වන විට ජවිපෙ දේශපාලනයේ ජාතිකවාදය මට බොහෝ ගැටළු සහගත විය. ලක්නද පුවත්පතේ ද සත්‍යවාදියෙකුගේ දිනපොත ලියන සුනිල් අයියා 2004 පෙබරවාරි 08 දා මෙසේ ලිවීය.

"දේශ හිතෙෂී ජාතික ව්‍යාපාරයේ ප්‍රථම ජාතික සමුළුවට ගියා. හිතට අතෑළු වූයේ එකම ප්‍රාර්ථනයයි. තවත් දස දහස් ගණනින් දේශහිතෙෂී මිනිසුන් මේ රටේ බිහි වේවා."

කාලය ගෙවී ගියේය. 2008 වසරේ අප්‍රේල් මාසයේ 08 වැනිදා පාර්ලිමේන්තුවේ විශේෂ ප්‍රකාශයක් කරමින් දේශ හිතෙෂී ජාතික ව්‍යාපාරයේ මහලේකම් විමල් වීරවංශ මහතා ජවිපෙන් වෙන්විය. කාලයක් තිස්සේ ජවිපෙ තුළ ජාතිවාදය හා ආගම්වාදය පෝෂණය කරමින් එය අතෑළතින් දියකර හැරීමේ කුමන්ත්‍රණය තිමා වී යයි බොහෝ දෙනෙකු සිතුව ද එය එසේ නොවීය. ජවිපෙ පෙළපාලි වල කාල්මාක්ස්, ඒංගල්ස්, ලෙනින්, චේ, මා ඕ ආදීන්ගේ ඡායාරූ සහිත කටවුටි සමඟ කපප්පෙටිපොල අදිකාරම් (සමිඳවය දූවිඩ බැව් නොදන්නා නිසා), දුටුගැමුණු, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ද වැඩම කරවීමේ ආනිසංස පහසුවෙන් බැහැර කරලිය නොහැකි නිසාම ජවිපෙට දඹර අමිල හිමිගේ හා වීනී හෙට්ටිගොඩගේ ප්‍රධානත්වයෙන් දේශ හිතෙෂී ජාතික මධ්‍යස්ථානය අටවන්නට සිදු විය. සුනිල් අයියාගේ ප්‍රාර්ථනාව ඉෂ්ඨ කරමින් මේවන විට දේශ හිතෙෂීන් දස දහස් ගණනින් බිහි වී තිබේ. ඒ නිසාම එල්.ටී.ටී.ඊ. සංවිධානය යුදමය වශයෙන් පරාජය කොට නිදහස් කරගත් බව කියන රටේ මුස්ලිම් වැසියාව නොඉවසන සමාජ ප්‍රමයක් ස්ථාපිතවෙමින් තිබේ. වීරවංශලා තැනූ පොළොවේ ඥානසාරලා බඩපිණුම් ගසමින් සිටිති. දර්ගා නගරයේ සිංහල දරුවෙකුට ලිංගික හිංසා කළ බව කියමින් මුස්ලිම් වෙළඳසැල් ගිනි තබා විනාශ කරන විට සිංහල බාලවයස්කාර දැරියන් සියයක් දූෂණය කොට සංවත්සරික සාද පවත්වන ප්‍රාදේශීය සිංහල දේශපාලනඥයින්ට එරෙහිව කටක් අරන්නට හැකි මිනිස් පුළුටක් සොයා ගැනීම අසීරු වී තිබේ.

ලක්දිව පත්‍රයේ කර්තෘ මණ්ඩල සාමාජිකයින් 1991 නොවැම්බරයේ බොරැල්ල ලක්දිව කාර්යාලයේ කර්තෘ මණ්ඩල කටයුතු අරඹමින් - (පසුපෙළ වමේ සිට) වීමල් වීරවංශ, ධර්ම ශ්‍රී කාරියවසම්, වීනී හෙට්ටිගොඩ, සුනිල් මාධව ප්‍රේමතිලක, ඩබල්ස් අලහප්පෙරුම, සුදත් මහදිවුල්වැව (ඉදිරි පෙළ වමේ සිට) රෝහිත භාෂණ අබේවර්ධන, මැනුවෙල් ජයසේකර, තිම්මිරිගාමු බණ්ඩාර

(කතුවරන් වූ මිනිසුන් - රෝහිත භාෂණ අබේවර්ධන)

ලක්දිව පත්‍රයේ කර්තෘ මණ්ඩල කටයුතු අරඹමින් (පසුපෙළ වමේ සිට) වීමල් වීරවංශ, ධර්ම ශ්‍රී කාරියවසම්, වීනී හෙට්ටිගොඩ, සුනිල් මාධව ප්‍රේමතිලක, ඩබල්ස් අලහප්පෙරුම, සුදත් මහදිවුල්වැව (ඉදිරි පෙළ වමේ සිට) රෝහිත භාෂණ අබේවර්ධන, මැනුවෙල් ජයසේකර, තිම්මිරිගාමු බණ්ඩාර

"ඇයි සහෝදරය සුනිල් අයිය ගැන හිතන්නෙ නැත්තෙ?" උත්තරය...

"මේකයි සහෝදරය, එයා ඩ්‍රින්ක්ස් ගන්නවනෙ. කොහොමද පක්ෂෙ ප්‍රතිපත්ති එක්ක නැතකට ගෙනියන්නේ?"

"මිනිසුන්ට හිනාවෙන්න නෙවෙයි මිනිසුන් එක්ක හිනාවෙන්න පුරුදු වෙමු. පශ්චාත් නූතනවාදීන් කරන්නේ මිනිසුන්ට හිනාවෙන එක." කට කොහින් සිනාසෙමින් හෙතෙම යන්නට යයි.

එකල බොහෝ දෙනෙකුගේ ලිපි කපා කොටා සකසනු ලැබුවේ බණ්ඩාර වැවගෙදර අයියාය. මුල්

26 වන පිටට